සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண சபையின் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018

12 ශ්‍රේණිය

## ගිණුම්කරණය II

33 S II

කාලය පැය 03 යි

සැලකිය යුතුයි -

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න.

**(01).** මාලි සහ නිමාලි 3:2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයට ලාභයෙන් 1/6 ක් සඳහා අමාලි 2017-4-1 දින බඳවා ගන්නා ලදී.

නව හවුල් ගිවිසුම් කොන්දේසි -:

*ප්‍රාග්ධන ගිණුම් ශේෂ සඳහා 10% ක පොලී ලබා දීම.
* මාලිට සහ අමාලිට පිළිවෙලින් සමකට රු:15000 ක් සහ රු:10000 ක් බැගින් වේතන හිමිවේ.
* හවුල්කරුවන් අතිරේකව සපයන ණය සඳහා 10% ක පොලී හිමි වේ.

2017-4-1 දින ගණනය කළ කීර්තිනාමය රු:300,000ක් වන අතර ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපිය යුතුය.බඳවා ගන්නා දින අමාලි මුදලින් රු:1,100,000 ක් සහ රු:900,000 ක් අගය වූ මෝටර් රථයක් ද ව්‍යාපාරයට යොදවන ලදී.එම මෝටර් රථයේ සුන්බුන් අගය රු: 100,000 ක් සහ ජීව කාලය වර්ෂ 10 ක්ද විය.

**I.** 2018-3-31 දිනෙන් අවසන් වර්ෂයේ මූලික පොත්වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

1. ගැනුම් ප්'නලයේ එකතුව රු: 420,000
2. විකුණුම් ප්'නලයේ එකතුව රු:750,000
3. වර්ෂයේ මුදල් ගනුදෙනු වල සාරාංශය

මුදල් පාලන ගිණුම (රු:000)

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ (2017-4-1) | 510 | අත්පිට ගැනුම් | 80 |
| අත්පිට විකුණුම් | 1770 | ණයහිමි ගෙවීම් | 360 |
| ණයගැති ලැබීම් | 570 | මෙහෙයුම් වියදම් | 83 |
| වෙනත් ආදායම් | 50 | ණයපොලී - නිමාලි | 10 |
| ප්‍රාග්ධනය - අමාලි | 1100 | හවුල් වේතන - මාලි | 80 |
| ණය - නිමාලි (2017-10-1) | 300 | අමාලි | 60 |
| | | ගැනිලි - මාලි | 30 |
| | | - අමාලි | 20 |
| | | - නිමාලි | 10 |
| | | ශේෂය ප/ගෙ (2018-3-31) | 3567 |
| | 4300 | | 4300 |
| ශේෂය ඉ/ගෙ | 3567 | | |

4. වර්ෂය තුල - ණයගැතියන්ට දුන් වට්ටම රු:30,000
   - ණය හිමියන්ගෙන් ලද වට්ටම රු: 70,000



Scanned by CamScanner

5. 2017-4-1 දිනට ශේෂයන් (රු:.000)

| | |
|---|---|
| තොගය | 100 |
| ණයගැතියන් | 300 |
| ණයහිමියන් | 230 |
| අඩමාණ ණය වෙන්කිරීම | 30 |
| ප්‍රාග්ධන ගිණුම - මාලි | 4000 |
| - නිමාලි | 3000 |
| ජංගම ගිණුම - මාලි | 200 |
| - නිමාලි | 150 |
| දේපල පිරියත හා උපකරණ (ශුද්ධ) | 6700 |

6. වර්ෂය අග ණයගැතියන්ගෙන් 10% ක් අඩමාණ ණය ගැලපිය යුතුයි.
7. 2018-3-31 තොගය රු:150,000 කි.
8. 2017-4-1 දිනට පැවති ශුද්ධ අගය මත දේපල පිරියත හා උපකරණ වාර්ෂිකව 5% ක් ක්ෂය කෙරේ.

අවශ්‍ය වන්නේ

1. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (විසර්ජනයක්ද සහිතව)
2. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන හා ජංගම ගිණුම
3. 2018-3-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ලකුණු 20)

(02). අ) සදුන්ගේ ව්‍යාපාරයේ 2018 අප්‍රේල් මස ණයට ගැනුම, ණයට විකුණුම සහ ඒ හා සම්බන්ධ අනෙකුත් ගනුදෙනු පහත දැක්වේ.

I. 2017 අප්‍රේල් මස ණයට විකුණුම

| ණය ගැතියො | 2018-4-1 ශේෂය | ණයට විකුණුම | ආපසු එවුම | බොල් ණය | මුදල් ලැබීම | දුන් වට්ටම |
|---|---|---|---|---|---|---|
| නිශාන් | 3800 | 12,500 | 1500 | - | 8400 | 600 |
| අශාන් | 1200 | 5000 | 200 | 1000 | 4700 | 300 |
| දේශාන් | 4000 | 24,500 | 100 | - | 9900 | 700 |
| | 9000 | 42,000 | 2700 | 1000 | 23,000 | 1600 |

II. 2017 අප්‍රේල් මස ණයට ගැනුම

| ණය හිමියො | 2018-4-1 ශේෂය | ණයට ගැනුම | ආපසු යැවුම | මුදල් ගෙවීම | ලද වට්ටම |
|---|---|---|---|---|---|
| යොමාල් | 5000 | 20,000 | 2000 | 10,100 | 900 |
| ලක්මාල් | 2500 | 17,500 | 1500 | 9500 | 600 |
| පියුමාල් | 3500 | 10,000 | - | 4800 | 200 |
| | 11,000 | 47,500 | 3500 | 24,400 | 1700 |

III. 2018 අප්‍රේල් මස ණයගැති ලැබීම ණයහිමි ගෙවීම හැර අනෙකුත් මුදල් ගනුදෙනු

| මුදල් ලැබීම | රු: |
|---|---|
| බැංකු ණය | 25000 |
| ගොඩනැගිලි කුලී | 8000 |
| අත්පිට විකුණුම් | 12,000 |

| මුදල් ගෙවීම | රු: |
|---|---|
| විදුලිය | 4500 |
| වැටුප් | 15000 |
| රක්ෂණ | 3500 |
| අත්පිට ගැනුම | 6000 |
| බැංකුණය වාරිකය | 7000 |

(පොලී රු: 1000ක්ද ඇතුලුව)



www.artsapi.lk

Scanned by CamScanner

IV. 2018-4-1 දිනට මුදල් හා බැංකු ශේෂය රු:63,000 කි.
අවශ්‍ය වන්නේ - 2018 අප්‍රේල් මාසය සඳහා
1. ගැනුම්, විකුණුම්,ආපසු යැවුම් සහ ආපසු එවුම් ජ'නල්
2. මුදල් ලැබීම් ජ'නලය හා මුදල් ගෙවීම් ජ'නලය
3. පොදු ලෙජරයේ පහත දැක්වෙන ගිණුම්
I. ණය ගැති පාලන ගිණුම
II. ණය හිමි පාලන ගිණුම
III. මුදල් පාලන ගිණුම

(ලකුණු 15)

ආ) දේශාන්ගේ ව්‍යාපාරයේ 2018-3-31 දිනට ණයගැති පාලන ගිණුමේ හර ශේෂය රු:58,000 ක් විය.නමුත් පහත හේතු මත එම ණයගැති පාලන ගිණුමේ ශේෂය එදිනට ණයගැති උපලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුවට සමාන නොවීය.

A) දුන් වට්ටම් රු:4100 ක් ණයගැති පාලන ගිණුමේ හරට සටහන් වීම
B) රු:12500 ක අමල්ට ණයට විකුණුම් ඔහුගේ ගිණුමේ සටහන් නොවීම
C) බොල්ණය රු:3200 ක් ගිණුම්වල රු:2300 ක් ලෙස සටහන් වීම
D) ජගත්ට දුන් වට්ටම් රු:1500 ක් ඔහුගේ ගිණුමේ හරට සටහන් වීම
E) විකුණුම් ජ'නලය රු:2500 ක් වැඩියෙන් එකත් කර තිබීම.

අවශ්‍ය වන්නේ
1. ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන්
2. සංශෝධිත ණයගැති පාලන ගිණුම
3. ණයගැති සැසඳුම් ප්‍රකාශය( ණය ගැති ශේෂ ලැයිස්තුවේ නිවැරදි කිරීමට පෙර තිබූ ශේෂ එකතුව සෙවීම සඳහා)

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

**(03).** නදීශාන්ගේ ව්‍යාපාරයේ 2018-1-1 දිනට වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | (රු:000) |
|---|---|
| ලී බඩු (ජීවකාලය වර්ෂ 10 යි) | 600 |
| තොග | 120 |
| ණයගැතියෝ | 300 |
| මුදල් | 280 |
| ණයහිමියෝ | 150 |
| බැංකු ණය | 250 |

2018 ජනවාරි මස ගනුදෙනු පහත දැක්වේ.

1. රු:200,000 ක් පිරිවැය වූ තොග ණයට ගැනීම
2. පිරිවැය රු: 10,000 ක් වූ තොග ආපසු යැවීම
3. පිරිවැය රු:180,000 ක් වූ තොග රු:270,000 කට ණයට විකිණීම
4. අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු:20,000 ක්ද යොදවමින් 2018-1-1 දින සිටි ණයහිමියන්ගේ ශේෂය 20% ක වට්ටමකට යටත්ව ගෙවා පියවීම
5. වැටුප් ගෙවීම රු:25,000 යි.
6. පිරිවැය රු: 10,000 ක් වූ තොග අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම
7. ණයගැතියන්ගෙන් 10% ක වට්ටම් අඩුකොට ලද මුදල රු:63,000 යි.
8. 2018-1-15 දින වර්ෂ 5ක ජීව කාලයක් සහිත නව උපකරණයක් මිලට ගැනීම රු:240,000 යි.
9. 2018 ජනවාරි මාසය සඳහා ලද විදුලි බිල රු:18,000 යි.
10. සියලු දේපල පිරියත හා උපකරණ ජනවාරි මාසයට ක්ෂය කිරීම
11. ස්ථාවර නියෝග මත ගෙවූ බැංකු ණය වාර්කය රු:22000 යි.එහි අඩංගු පොලිය රු:2000 යි
12. 2018 ජනවාරි මාසය සඳහා බැංකුව අයකළ ගාස්තුව රු:3000 ක් සහ ණයගැති ප්‍රේෂණ රු:80,000 ක් බව බැංකු ප්‍රකාශයේ දැක්විණි.


www.artsapi.lk
Scanned by CamScanner

අවශ්‍ය වන්නේ

1.පහත සඳහන් ගිණුම්කරණ සමීකරණයේ ඉහත අංක 1-12 තෙක් ගනුදෙනු වල ද්විත්ව බලපෑම් අගයන් සහිතව දැක්වීම (+හො - ලෙස)

| ලිබඩු උපකරණ | + තොග | +ණයගැති | +බැංකු | = හිමිකම | + ණයහිමි | +බැංකුණය |
|---|---|---|---|---|---|---|

2.ශුද්ධ වත්කම් ක්‍රමයට 2018-ජනවාරි මස ලාභය ගණනය කිරීම

3.2018-1-31 දිනට පහත ශේෂයන් වල අගය දැක්වීම

I. බැංකු ගිණුම

II.ණයගැති ගිණුම

III.බැංකු ණය ගිණුම

IV.2018-1-31 දිනට තොගය (ලකුණු 15)

ආ) පහත දැක්වෙන ගනුදෙනු ඇසුරින් බොල් හා අඩමාණ ණය වෙන්කිරීම ගිණුම සකස් කරන්න.

| | රු: |
|---|---|
| 2017-4-1 ණයගැති ශේෂය | 120,000 |
| ණයට විකුණුම් | 650,000 |
| ආපසු එවුම් | 30,000 |
| බොල්ණය | 10,000 |
| දුන් වට්ටම් | 25,000 |
| මුදල් ලැබීම් | 475,000 |
| පෙර වර්ෂයේ කපාහල බොල්ණය නැවත ලැබීම් ගිණුමේ ශේෂය | 5,000 |

ව්‍යාපාරය සෑම විටම ණයගැති ගිණුමේ ශේෂය මත 10% ක අඩමාණ ණය වෙන්කිරීමක් සිදු කරයි.

අවශ්‍ය වන්නේ

1.බොල් හා අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම ( 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

**(04)**. අ) රුවංග ගේ ව්‍යාපාරයේ සියලු ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් ඇසුරින් සිදු කරයි.2018 ජනවාරි මාසයේ මුදල් පාලන ගිණුමේ ගනුදෙනු සවිස්තරව පහත දක්වා ඇත.

මුදල් පාලන ගිණුම (බැංකු ගිණුම) (රු:000)

| | | | |
|---|---|---|---|
| 2018-1-1 ඉ/ගෙ/ශේෂය | 600 | අත්පිට ගැනුම් (චෙක් 122403) | 32 |
| අත්පිට විකුණුම් (චෙක් - 100424) | 54 | ණයහිමි දුලිප් (චෙක් 122404) | 15 |
| ණයගැති - ශිවා (චෙක් 05692) | 12 | වැටුප් (චෙක් 122405) | 25 |
| ලද කඩකුලී - (චෙක් 24356) | 28 | විදුලිය (චෙක් 122406) | 10 |
| ණයගැති - ලලිත් (චෙක් -17281) | 13 | ණයහිමි - ජනිත් (චෙක් 122407) | 18 |
| | | 2018-1-31 ශේෂය ප/ගේ | 607 |
| | 707 | | 707 |
| 2018.02.01 ශේෂය ඉ/ගෙ | 607 | | |





www.artsapi.lk

Scanned by CamScanner

2018 ජනවාරි මාසය සඳහා ලද බැංකු ප්‍රකාශය පහත දැක්වේ. (රු:000)

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| 2018-1-1 ශේෂය | | | 591 |
| චෙක්පත් -122401 | 11 | | 580 |
| චෙක් තැන්පතු - 34102 (2018 පෙබරවාරි) | | 20 | 600 |
| චෙක් තැන්පතු - 100424 | | 54 | 654 |
| චෙක්පත් - 122403 | 32 | | 622 |
| චෙක් තැන්පතු - 05692 | | 12 | 634 |
| චෙක්පත් - 122406 | 10 | | 624 |
| චෙක්පත් - 122405 | 25 | | 599 |
| සෘජු ප්‍රේෂණ - ලාභාංශ | | 8 | 607 |
| නිත්‍ය නියෝග - රක්ෂණ වාරිකය | 3 | | 604 |
| චෙක්පත් -422405 (වෙනත් ගිණුම් හිමියෙකුගේ) | 10 | | 594 |
| බැංකු ගාස්තු | 2 | | 592 |

චෙක්පත් අංක 422405 ව්‍යාපාරයට අයත් නොවන චෙක්පතක් බව ආවරණය විය.අවශ්‍ය වන්නේ

1.පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය (2017 - ජනවාරි මාසයට)

2.සංශෝධිත මුදල් පාලන ගිණුම (බැංකු ගිණුම)

3.2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

ආ) ක්‍රමානුකූලව ගිණුම් පොත් තබා නොගත් කල්හාරගේ ව්‍යාපාරයේ 2018-1-1 දින සිට 2018-3-31 දින දක්වා කාර්තුව සඳහා ලබාගත් තොරතුරු පහත දැක්වේ.

I. 2018-1-1 හා 2018-3-31 දිනයන්හි වත්කම් හා වගකීම්

| | 2018-1-1 (රු:000) | 2018-3-31 (රු:000) |
|---|---|---|
| ණයගැතියෝ | 250 | 380 |
| තොගය | 150 | 350 |
| කලින් ගෙවූ රක්ෂණය | 10 | 25 |
| මුදල් හා බැංකු | 500 | ? |
| ගෙවිය යුතු විදුලිය | 50 | 70 |
| ගෙවිය යුතු VAT | 30 | 45 |
| දේපල පිරියත හා උපකරණ | 1000 | 980 |

II. මුදල් ගනුදෙනු සාරාංශය

| | |
|---|---|
| ණයගැති ලැබීම් (රු: 20000 ක වට්ටම් අඩුකළ පසු ) | රු: 1,100,000 |
| ණයහිමි ගෙවීම් (රු: 30000 ක වට්ටම් අඩු කළ පසු) | රු: 780,000 |
| විදුලිය | රු: 10,000 |
| රක්ෂණය | රු: 30,000 |
| වැටුප් | රු: 40,000 |
| VAT | රු: 80,000 |

III. දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම/විකිණීම සිදු වී නැත.

IV. ව්‍යාපාරය පිරිවැය මත 25% ක දළ ලාභ ප්‍රතිශතයක් තබා ගනිමින් විකුණුම් මිල නියම කරයි.

අවශ්‍ය වන්නේ

1. 2018.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය



www.artsapi.lk
Scanned by CamScanner

(05). අ) දසුන්ගේ ව්‍යාපාරය තොග නිකුත් කිරීම සඳහා FIFO (පෙර ඇතුළු පෙර පිට) ක්‍රමය භාවිතා කරයි. 2018 මාර්තු මාසයේ ගබඩාවේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | ඒකක ප්‍රමාණය | මිල |
|---|---|---|
| 2018-3-1 තොගය | 200 | 20 |
| 2018-3-5 ගැනුම් | 300 | 22 |
| 2018-3-8 ආපසු යැවුම් | 50 | 22 |
| 2018-3-15 නිකුත් කිරීම | 250 | ? |
| 2018-3-20 ගැනුම් | 300 | 25 |
| 2018-3-25 නිකුත් කිරීම | 350 | ? |
| 2018-3-28 ගැනුම් | 300 | 26 |

අවශ්‍ය වන්නේ

1. 2018 මාර්තු මාසය සඳහා ගබඩාවේ තොග ලෙජරය FIFO (පෙර ඇතුලු පෙර පිට) ක්‍රමයට

ආ) ව්‍යාපාරයක් සතු දේපල පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වත්කම | පිරිවැය (රු:000) | මිලට ගත් දිනය | ජීව කාලය | සුන්බුන් අගය (රු:000) |
|---|---|---|---|---|
| ඉඩම | 2000 | 2015-4-1 | - | - |
| මෝටර් රථ | 3500 | 2015-4-1 | වර්ෂ 6 | 500 |
| ලීබඩු | 1100 | 2015-10-1 | වර්ෂ 5 | 100 |

2018-3-31 දිනෙන් අවසන් වර්ෂය තුල පහත දෑ සිදු වී ඇත.

1. ඉඩම 2017-4-1 දින රු: 2,300,000 කට ප්‍රත්‍යාගණනය කිරීම
2. මෝටර් රථයට 2017-4-1 දින රු:400,000 ක ප්‍රාග්ධන වැයක් දැරීම නිසා එහි ජීව කාලය තවත් වර්ෂ 2 කින් වැඩි වී ඇත.
3. 2017-10-1 දින ලීබඩු රු: 850,000 කට විකිණීම

අවශ්‍ය වන්නේ

1. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල පිරියත උපකරණ ක්ෂය වීම වෙන් වෙන්ව ගණනය කර දැක්වීම.
2. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත ගිණුම්
   I. ඉඩම ගිණුම
   II. මෝටර් රථ ගිණුම සහ මෝටර් රථ ක්ෂය වෙන්කිරීම ගිණුම
   III. ලීබඩු ගිණුම සහ ලී බඩු ක්ෂය වෙන් කිරීම ගිණුම
   IV. ලී බඩු විකුණුම් ගිණුම

www.artsapi.lk



Scanned by CamScanner

(06). අල්මාරි නිෂ්පාදනයේ යෙදෙන ව්‍යාපාරයක් වූ කුරේ සමාගමේ පොත්වලින් 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිරිවැය තොරතුරු ලබා දී ඇත.

| | රු: |
|---|---|
| 2016-4-1 තොග - අමුද්‍රව්‍ය | 350 |
| නොනිමි ද්‍රව්‍ය | 610 |
| නිමි ද්‍රව්‍ය | 400 |
| මෙවලම් | 150 |
| ගැනුම්- අමුද්‍රව්‍ය | 5200 |
| ආපසු යැවුම් | 300 |
| ගෙනඒමේ කුලී | 100 |
| සෘජු බලපත්‍ර ගාස්තු | 200 |
| කම්හල් සුපරීක්ෂක ගාස්තු | 500 |
| කම්හල් කුලී | 350 |
| සෘජු නිෂ්පාදන ශ්‍රමික වැටුප් | 1200 |
| සෘජු වෙනත් වියදම් | 300 |
| කම්හල් අලුත්වැඩියා | 120 |
| පරිපාලන කළමණාකරු වැටුප් | 800 |
| විදුලිය (1/4 ක් කම්හලට වේ.) | 600 |
| යන්ත්‍ර - පිරිවැයට | 2500 |
| ඉන්ධන | 220 |
| ලිපිකරු වැටුප් | 300 |
| මෙවලම් මිලට ගැනුම් | 450 |
| විකුණුම් | 18200 |

අතිරේක තොරතුරු

1. යන්ත්‍ර පිරිවැය මත 10% ක් වාර්ෂිකව ක්ෂය කෙරේ.
2. 2018-3-31 දිනට තොග - අමුද්‍රව්‍ය රු: 400,000
   - නොනිමි රු: 250,000
   - නිමිද්‍රව්‍ය රු: ?
   - මෙවලම් රු:200,000
3. වර්ෂය මුල නිමි ඒකක 10,000 ක් වූ අතර වර්ෂයේ නිපදවූ ඒකක ගණන 200,000 ක් වේ.වර්ෂය තුල විකුණුම් ඒකක 180,000 කි.

අවශ්‍ය වන්නේ

I. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛණය

II. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය ගණනය කිරීම

ආ) පහත දැක්වෙන්නේ සාලියගේ ව්‍යාපාරයේ 2018-3-31 දිනට තොග පිළිබඳ තොරතුරු වේ.

| අයිතමය | ඒකක ප්‍රමාණය | පිරිවැය රු: | ශුද්ධ උපලබ්ධි අගය |
|---|---|---|---|
| A | 200 | 10 | 13 |
| B | 50 | 30 | 28 |
| C | 80 | 20 | 17 |

අවශ්‍ය වන්නේ

I. අයිතම් ක්‍රමය මත තොග අගය කරන්නේ යැයි සලකා 2018-3-31 දිනට තොගය ගිණුම් ගත කිරීමේ ජ'නල් සටහන (තොග/ ගණනය කිරීම් පැහැදිලිව දැක්වීම අවශ්‍ය වේ)



www.artsapi.lk
Scanned by CamScanner

(07) 2017-4-1 දින ආරම්භ කළ ශක්ති ක්‍රීඩා සමාජය සාමාජිකයන් 50 දෙනෙකුගෙන් ආරම්භ කළ අතර වාර්ෂික සාමාජික මුදල වන රු:2000 ක් සෑම සාමාජිකයෙකුම ඇතුලත් වන දිනයේදී ලබා දිය යුතුයි.

2017-10-1 දින නව සාමාජිකයන් 10 දෙනෙකු බඳවා ගන්නා ලදී.සියලුම සාමාජිකයන් නියමිත මුදල් නිසිපරිදි ලබා දී ඇත.

ක්‍රීඩා සමිතිය සතු පිහිණුම් තටාකය සාමාජිකයින්ට දිනකට රු:200 ක ගාස්තුවක් අයකර ලබා දෙනු ලබන අතර බාහිර ආයතන වල පිහිණුම් තරඟ සඳහා දිනකට රු:10,000 ක් අයකර ලබා දෙයි.බාහිර තරඟ සඳහා පිහිණුම් තටාකය ලබා දීමේදී දිනය වෙන් කරනු ලබන අවස්ථාවේදී ගාස්තුවෙන් 30% ක අත්තිකාරමක් ලබා ගන්නා අතර ඉතිරිය තරඟ දිනයේදී ලබා දිය යුතුය.

I.සාමාජිකයන් පිහිනුම් තටාකය භාවිතා කළ දින ගණන

| සාමාජික සංඛ්‍යාව | දින ගණන |
|---|---|
| 30 | 10 |
| 20 | 20 |
| 10 | 30 |

II. බාහිර ආයතන පිහිණුම් තටාකයේ තරඟ පැවැත්වූ දිනයන් 6 ක් වන අතර තවත් තරඟ 3 ක් සඳහාද අත්තිකාරම් ලබා දී ඇත.එම තරඟ 2018 අප්‍රේල් මාසයෙන් පසු පැවැත්වීමට නියමිත වේ.

III.ක්‍රීඩා සමිතියේ අනෙකුත් ලැබීම් හා ගෙවීම් මෙසේය.

| | |
|---|---|
| <u>ලැබීම්</u> | |
| පරිත්‍යාග | රු: 8000 |
| සඟරා විකිණීමෙන් | රු: 3000 |
| <u>ගෙවීම්</u> | |
| පිරිසිදු කිරීම් | රු: 20,000 |
| වැටුප් | රු: 30,000 |
| විදුලිය | රු: 6,000 |
| සනීපාරක්ෂක ද්‍රව්‍ය | රු: 5,000 |

IV. ක්‍රීඩා සමිතියට රු: 40,000 ක් වටිනා වර්ෂ 4 ක ජීව කාලයක් සහිත ලීබඩු උපකරණ 2017-4-1 දින පරිත්‍යාග ලෙස ලැබී ඇත.මෙම පරිත්‍යාගය වර්ෂ 4 ක් තුල ආදායම් ලෙස හඳුනා ගැනීමට තීරණය වී ඇත.

අවශ්‍ය වන්නේ

1. 2018-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2. 2018-3-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය
3. 2018-3-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම

*****



www.artsapi.lk

Scanned by CamScanner